122 වන අධිකාරය

# ඇටෝර්නි බලපත්‍ර

මිල: ශත 25 යි

තැපැල් ගාස්තුව: ශත 15 යි

ශක් 7441--3,006 (71/19)--

රජයේ මුද්‍රණාලය, කොළඹ

# 122 වන අධිකාරය

## ඇටෝර්නි බලපත්‍ර

ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි කිරීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා වූ ආඥාපනතකි. ආඥාපනත් :—

1902 අංක 4
1913 අංක 9
1939 අංක 33

(1902 ජූනි 1 වන දින)

1. මේ ආඥාපනත ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය. ලුහුඬු නාමය

2. මේ ආඥාපනතෙහි කාර්යයන් සඳහා සහ විෂයෙහි හෝ පද සම්බන්ධයෙහි අර්ථොක්තියට ප්‍රතිවිරුද්ධ කිසිවක් ඇතහොත් මිස— අර්ථ නිරූපණය

"ඇටෝර්නි බලකරු" යන්නට ඒ ඇටෝර්නි බලය දරණ සෑම තැනැත්තකු ඇතුළත් විය යුතු ය ;

"ඇටෝර්නි බලපත්‍රය" යන්නට නීතිඥයකුට හෝ නීති නියෝජිත යකුට දෙන ලද්දක් නො වන්නා වූත් යම් කර්තව්‍යයක් කිරීමට, යම් දෙයක් කිරීමට හෝ යම් වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යෑමට එක් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුට දෙන ලද්ද වූත් සාක්ෂි කරුවන් දෙදෙනකු ඉදිරිපිට ලියා අත්සන් කරනු ලැබූ හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු ඉදිරිපිට ලියා අත්සන් කරනු ලැබූ හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු විසින් හෝ සමාදාන විනිශ්චයකරුවකු, රෙජිස්ට්‍රාර් වරයකු, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු විසින් හෝ යම් විනිශ්චයකරුවකු හෝ මහෙස්ත්‍රාත්වරයකු, බ්‍රිතාන්‍ය තානාපතිවරයකු හෝ උප තානාපති වරයකු හෝ මහා රාජිනියගේ නියෝජිතයකු විසින් ලියා සහතික කරනු ලැබූත් යම් ලිඛිත බලයක් හෝ බලධාරිකමක් ඇතුළත් වේ ;
තවද

"රෙජිස්ට්‍රාර් ජනරාල්" යන්නට සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් හා රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ හෝ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ යුතුකම් තත්කාලයෙහි නීත්‍යනුකූල ව ඉටුකරන යම් තැනැත්තෙක් ද ඇතුළත් වෙති.

3. තමාගේ ඇටෝර්නි බලපත්‍රය මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරවා ගැනීමට අදහස් කරන යම් ඇටෝර්නි බලකරුවකුට එය එසේ ලියාපදිංචි කරවා ගැනීමට හිමිකම් ලැබිය යුතු අතර, ඔහු විසින් එම කාර්යය සඳහා සැබෑ පිටපතක් බවට ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු විසින් සහතික කරන ලද එම බලපත්‍රයේ පිටපතක් ද සමඟ එම ඇටෝර්නි බලපත්‍රය රෙජිස් ට්‍රාර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වත් හැර තමා දන්නා හා විශ්වාස කරන තාක් දුරට ඒ ඇටෝර්නි බලපත්‍රය නිර්ව්‍යාජ බවට හා තවමත් වලංගු ව පවතින බවට දිවුරුම් පෙත්සමක් ද ඉදිරිපත් කළ යුතු ය. ඒ පිටපතෙහි නිරවද්‍යතාව ගැන තමා සෑහීමට පත් වීමෙන් පසු රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කොට, ඒ පිටපත ගොනු කර, ඒ ලියාපදිංචි කිරීම කළ බව ද ලියාපදිංචි කිරීමේ දිනය ද ප්‍රකාශ වන තමා විසින් අත්සන් කළ සහතිකයක්, ඒ ලියාපදිංචි කිරීම සටහන් කළ හා ඒ පිටපත ගොනු කළ ලේඛන පොතේ කාණ්ඩය සහ පත් ඉරුව පිළිබඳ යොමුව ද සමඟ ඒ පිටපත මත හා ඇටෝර්නි බලපත්‍රය මත පිටසන් කොට, බලපත්‍රය ඉදිරිපත්

ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කළ හැකි බව

[2§ 1939 අංක 33]

2§ 1939 අං.ක 33]
ලියාපදිංචි කිරීම සටහන් කළ යුතු බව

කළ තැනැත්තා වෙත එය ආපසු යැවිය යුතු ය. ඒ ලියාපදිංචි කිරීම උප ලේඛනයෙහි නියමිත ආකෘතිය අනු ව තබා ගත යුතු පොතක සටහන් කළ යුතු ය.

අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම රෙජිස්ට්‍රාර්ජනරාල් වෙත නිවේදනය කළ හැකි බව හා ප්‍රසිද්ධ කළ හැකි බව

4. ලියාපදිංචි කරන ලද යම් ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ පරිච්ඡින්න කරනු ලැබූ අවස්ථාවක දී හෝ යම් ඇටෝර්නි බලකරුවකු ඒ ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියා කිරීම අවසාන කරන අවස්ථාවක, ඒ අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම ලියාපදිංචි කරවා ගැනීමට දීමනාකරු හෝ ඇටෝර්නි බලකරු අදහස් කරනහොත් එය එසේ ලියාපදිංචි කරවා ගැනීමට දීමනාකරුට හෝ ඇටෝර්නි බලකරුට හිමිකම් ලැබිය යුතු අතර එම කාර්යය සඳහා, දීමනාකරු හෝ ඇටෝර්නි බලකරු විසින් ඒ අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම එය තහවුරු කරන දිවුරුම් පෙත්සමක් සමඟ රෙජිස්ටාර්ජනරාල් වෙත නිවේදනය කළ යුතු වන් හැර ගැසට් පත්‍රයෙහි ද කොළඹ දී ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රසිද්ධ කෙරෙන දිනපතා ප්‍රවෘත්ති පත්‍ර අඩු ගණනේ තුනක නිකුත් කිරීම් තුනක ද ඉංග්‍රීසි භාෂාවෙන් ඒ නිවේදනය ප්‍රසිද්ධ කිරීමට ද සැලැස්විය යුතු ය ; එහෙත් ඒ නිවේදනය හා ප්‍රසිද්ධ කිරීම කරන තුරු තමාගේ ඇටෝර්නි බලකරුගේ සියලු ක්‍රියාවලට දීමනාකරු වග කිව යුතු ලෙස සහ ඒ ක්‍රියාවලින් ඔහු බැඳී සිටින ලෙස ගත යුතු ය :

නිවේදනය නො කිරීමේ බලපෑම

එ සේ වුව ද මේ වගන්තියෙහි කිසිවක්, නීතිය ක්‍රියාත්මක වීමෙන් ශූන්‍ය බවට පත් වන හෝ අවසාන වන යම් ඇටෝර්නි බලපත්‍රයක් කෙරෙහි බලපෑමක් ඇති කරන ලෙස හෝ ඒ ඇටෝර්නි බලකරු සමඟ ක්‍රියා කරන යම් තැනැත්තකුට දීමනාකරු හෝ ඇටෝර්නි බලකරු විසින් කල් තබා දැනුම්දීමක් කිරීමට සම්බන්ධ හෝ නියම කරන යම් ඇටෝර්නි බලපත්‍රයකට ඇතුළත් යම් අතුරු වගන්තියක්, අතුරු විධානයක් හෝ කොන්දේසියක් ක්‍රියාත්මක වීම කෙරෙහි හෝ ඒ අතුරු වගන්තියෙහි, අතුරු විධානයෙහි හෝ කොන්දේසියෙහි විධිවිධාන පිළිපැදීමට හා ක්‍රියාවෙහි යෙදවීමට අපොහොසත් වීමේ හේතුවෙන් පැන නැඟෙන යම් ප්‍රතිඵල හා වගකීම් කෙරෙහි බලපෑමක් ඇති කරන ලෙස හෝ හානි කර වන ලෙස තේරුම් නො ගත යුතු ය.

අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම ලියාපදිංචි කිරීම
[3§ 1939 අංක 33]

5. 4 වන වගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද අවලංගු කිරීමේ හෝ පරිච්ඡින්න කිරීමේ සෑම නිවේදනයක් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ලියාපදිංචි කළ යුතු අතර, ඒ අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම ලියාපදිංචි කිරීම සටහන් කරනු ලැබූ හා නිවේදනය ගොනු කරනු ලැබූ ලේඛන පොතේ කාණ්ඩය හා පත්ඉරුව පිළිබඳ යොමුවක් සමඟ ඒ අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම ද තමා පිටසන යොදන දිනය ද ප්‍රකාශ වන තමා විසින් අත්සන් කළ සහතිකයක් ඔහු විසින් ඇටෝර්නි බලපත්‍රයේ පිටපත මත පිටසන් කළ යුතු ය. ඒ අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම උපලේඛනයෙහි නියමිත ආකෘතිය අනු ව තබා ගත යුතු පොතක සටහන් කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්ජනරාල් විසින් ලේඛන ගොනු කළ යුතු බව
[... 1939 අංක 33]

ලේඛන [illegible]

6. රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තමා වෙත ලැබෙන සියලුම ඇටෝර්නි බලපත්‍රවල පිටපත් හා අවලංගු කිරීමේ හෝ පරිච්ඡින්න කිරීමේ සියලු ම නිවේදන, ඒවාට අදාළ දිවුරුම් පෙත්සම් සමඟ, ඒවායේ පහසු නාමාවලී හා සූචි සහිතව , පරිස්සමෙන් ගොනු කොට සුරක්ෂිත ව තබා ගත යුතු ය.

ඒ ලේඛන පරීක්ෂා කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යම් තැනැත්තකු විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ විට, ඒ තැනැත්තා විසින් එ සේ යෝදිසි කිරීම සඳහා ඒ සියලු ලේඛන විවෘත ව තිබිය යුතු ය.

7. 3 වන වගන්තිය යටතේ තම කාර්යාලයෙහි ගොනු කරනු ලැබ ඇති ඇටෝර්නි බලපත්‍රයක යම් පිටපතක, සැබෑ පිටපතක් බවට තමා විසින් සහතික කළ පිටපතක්, ලියවිල්ලකින් ඉල්ලුම් කරනු ලබන යම් තැනැත්තකුගෙ ඉල්ලීම පිට රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කළ යුතු ය. ඇටෝර්නි බලපත්‍රය පිළිබඳ යම් අවලංගු කිරීමක් හෝ පරිච්ඡින්න කිරීමක් ලියාපදිංචි කර ඇතහොත් ඒ ලියාපදිංචි කිරීමෙ දිනය හා ඒ අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම නිවේදනය කරන ලද්දේ කවුරුන් විසින් ද යන බව සමග, ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීමෙ දිනය හා ඒ ලියාපදිංචි කිරීම සඳහා ඇටෝර්නි බලපත්‍රය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද යන බව ප්‍රකාශ කෙරෙන රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අත්සන් කළ සහතිකයක් ඒ සහතික පිටපතට එක් එළ යුතු ය.

ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රවල පිටපත්

[5 § 1939 අංක 53]

8. ඇටෝර්නි බලපත්‍රයෙහි මුල් පිටපත ඉදිරිපත් නො කරන ලද්දේ වුව ද එය නො තකා, මේ ආඥපනතෙහි 7 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ සෑම සහතික පිටපතක්, ඇටෝර්නි බලපත්‍රය ලියා අත්සන් කර ඇතැයි සැලකෙන තැනැත්තා විසින් ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපත ලියා අත්සන් කළ බවට ද ඒ මුල් ඇටෝර්නි බලපත්‍රයෙහි අඩංගු කරුණුවලට ද බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂිය වශයෙන් යම් අධිකරණ නීතිකෘත්‍යයක දී පිළිගත යුතු ය :

රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ පිටපත් සාක්ෂි වශයෙන් පිළිගත යුතු බව

එසේ වුව ද ඒ බලපත්‍රය ලියා අත්සන් නො කළ බව යම් අවස්ථාවක දී ඒ තැනැත්තා පවසතහොත් මුල් බලපත්‍රය ලියා අත්සන් කිරීම පිළිබඳ බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂිය වශයෙන් ඒ සහතික පිටපත පිළි නො ගත යුතු ය.

9. මේ ආඥපනත යටතේ පහත දැක්වෙන ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්ට ගෙවිය යුතු අතර, යම් ඇටෝර්නි බලපත්‍රයක් ලියාපදිංචි කිරීමෙ හෝ යම් ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීමෙ හෝ පරිච්ඡින්න කිරීමෙ යම් නිවේදනයක් ලියාපදිංචි කිරීමෙ අවස්ථාවක දී රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් ගොනු කරනු ලබන පිළිවෙලින් ඇටෝර්නි බලපත්‍රයේ පිටපතට තැනහොත් නිවේදනයට ද අන් සියලු ම අවස්ථාවල දී ඒ ගාස්තු ගෙවිය යුතු ව ඇත්තේ යම් ලේඛනයක් සම්බන්ධයෙන් ද ඒ ලේඛනයට ද ඇලවිය යුතු මුද්දරවලින් ඒ ගාස්තු ගෙවිය යුතු ය :—

ගාස්තු

[6 § 1939 අංක 33]

| | රු. | ශ. | |
|---|---|---|---|
| යම් ඇටෝර්නි බලපත්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා ... | 3 | 75 | [6 § 1939 අංක 33] |
| ලියාපදිංචි කරන ලද යම් ඇටෝර්නි බලපත්‍රයක් අවලංගු කිරීම හෝ පරිච්ඡින්න කිරීම පිළිබඳ යම් නිවේදනයක් ලියාපදිංචි කිරීම සඳහා ... ... ... ... | 1 | 0 | |
| ලේඛන සෝදිසි කිරීම පිළිබඳ සෑම ඉල්ලීමක් සඳහා | 1 | 0 | |
| ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක සහතික පිටපතක් සඳහා වූ සෑම ඉල්ලීමකට ... ... ... | 1 | 0 | |
| 7 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම සහතික පිටපතක් සඳහා, වචන 120ක පත්‍ර්‍රුවකට ... ... | 0 | 50 | [6 § 1939 අංක 33] |

## උපලේඛනය

(3 හා 5 වන වගන්ති)

| අනුක්‍රමික අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | ඇටෝර්නි බලපත්‍රයේ විස්තරය (නොතාරිස් ඔප්පුවක්ද, ලිපියක්ද විදුලි පණිවුඩයක්ද ආදී වශයෙන්) | දීමනාකරු | ලැබුම්කරු | බලපත්‍රවල දිනය | ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින්ද යන බව | පිටපත ගොනුකළ කාණ්ඩය හා පත්ඉරුව | අවලංගු කිරීමේ හෝ පරිච්ඡින්න කිරීමේ නිවේදනයෙහි දිනය | නිවේදනය කරන ලද්දේ කවුරුන් විසින්ද යන බව | නිවේදනය ලියාපදිංචි කිරීමේ දිනය | නිවේදනය ගොනුකළ කාණ්ඩය හා පත්ඉරුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |